DOI: 10.31357/fhssmph.2000.00069

## උපදේශකවරුන්ගේ ප්‍රකාශය

අතෘප්තිය පිළිබඳ බෞද්ධ හා සාංදෘෂ්ටිකවාදී විග්‍රහය නමැති මෙම පර්යේෂණ නිබන්ධය අපගේ උපදෙස් පරිදි මෙම පර්යේෂකයා විසින් සම්පාදනය කරන ලද බව මෙයින් සහතික කරමු.

..........................................

මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර

..........................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්.එම්. මොරටුවගම

## පර්යේෂකයාගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය උපදේශකවරුන්ගේ අනුමැතියට යටත්ව මා විසින් ස්වාධීනව සම්පාදනය කරන ලද්දක් බව මෙයින් සහතික කරමි.

..........................................

ඩබ්ලිව්.එම්. යාපාරත්න

31 OCT 2000

30 OCT 2001

# අතෘප්තිය පිළිබඳ බෞද්ධ හා සාංදෘෂ්ටිකවාදී විග්‍රහය

ඩබ්.එම්. යාපාරත්න

ලියාපදිංචි අංකය : **GS/HU/87/96**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බෞද්ධ දර්ශනය පිළිබඳ
දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණ නිබන්ධය

2000

# උපකාරානුස්මෘතිය

"අතෘප්තිය පිළිබඳව බෞද්ධ හා සාංදෘෂ්ටිකවාදී විග්‍රහය" නමින් දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන මෙම ස්වාධීන නිබන්ධය සම්පූර්ණ කර ගැනීමට මා හට සහයෝගය දුන් බොහෝ දෙනෙකි.

නිබන්ධය සඳහා සුදුසු මාතෘකාවක් තෝරා ගැනීමේදී මෙන්ම අඩුපාඩු දුරුකරලීමට උපදේශකත්වයෙන් කටයුතුවල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මහතාට හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.එම්. මොරටුවගම මහතාට පළමුව මාගේ ගෞරවාන්විත ස්තූතිය පුදකරමි.

මාගේ අධ්‍යයනය සම්බන්ධයෙන් මතු වූ ගැටළු නිරාකරණය කර ගැනීමට සුළු කාලයක් හෝ කැපකරමින් උපකාර කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගේ, මහාචාර්ය තිස්ස කාරියවසම් හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ මහාචාර්ය පී.ඩී. ප්‍රේමසිරි ඇඳුරුතුමාට බෙහෙවින් කෘතඥ වෙමි.

ඇතැම් පරිවර්තනවලදී මට සහයෝගය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය රත්න විජේතුංග,ආචාර්ය ආරියපාල පෙරේරා, ආචාර්ය නායිම්බල ධම්ම දස්සි, ආචාර්ය අභය බණ්ඩාරනායක යන මැතිතුමන්ලා හා ගරු ස්වාමින් වහන්සේ සිහි කරන්නේ හදපිරි භක්තියෙනි.

නවතැන් සපයා දෙමින් අවශ්‍ය පොත් පත් සපයා දෙමින් හැම අතින්ම සහයෝගය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන මහතාට විශේෂයෙන් කෘතඥ වෙමි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඥානදාස පෙරේරා මහතාගෙන් ද ලැබුනේ නොමඳ සහයෝගයකි.

මෙම අධ්‍යයන කාර්යයේදී නුගේගොඩ සුභද්‍රාරාම පරිවෙන් පුස්තකාලයෙන් හා ආචාර්ය මණ්ඩලය දුන් සහය සිහිපත් කළ යුතුයි. පුස්තකාලයාධිපති රංජිත් මහනාම මහතා විශේෂයෙන් සිහිපත් කළ යුතුය. පොත පත සපයා දෙමින් උදව් කළ මානෑවේ වජිර බුද්ධි හිමියන් හා පන්නල සුමේධ හිමියන්ට ගෞරව පූර්වක ස්තූතිය පුද කරමි. ව්‍යාකරණ දෝෂ සකසා ගැනීමට සහාය දුන් පරමානන්ද හිමියන්ට ද, සහයෝගය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජයලතා මැදවත්ත මහත්මිය ඇතුළු හිතවතුන්ටත්, සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණේ හිතවතුන්ටත් පරිගණක ගත කර දුන් "පින්ක් කොමියුනිකේෂන් ආයතනයේ" චින්තක හා එස්.ඩී. දයාරත්න යන මහත්වරුන්ටත්, මා දිරි ගැන්වූ සැමටත් හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

## පටුන


පිටු අංකය

සංකේත නිරූපණය I

අන්තර්ගතය II

හැඳින්වීම III-IV

**ප්‍රථම පරිච්ඡේදය**

**ඓතිහාසික පසුබිම** 1-27

1.1 භගවද් ගීතාව හා ජෛන ආගම 1-11

1.2 බටහිර දර්ශන ඉතිහාසය 12-23

**දෙවන පරිච්ඡේදය**

අත්‍යුත්පත්තිය පිළිබඳ බෞද්ධ ආකල්ප 28-61

2.1 මිනිස් ස්වභාවය පිළිබඳ බෞද්ධ ආකල්ප 28-33

2.2 දුක හා අත්‍යුත්පත්තිය 33-41

2.3 විමුක්ති මාර්ගය 41-53

**තෙවන පරිච්ඡේදය**

අත්‍යුත්පත්තිය හා සාංදෘෂ්ටිකවාදය 62-89

3.1 මනුෂ්‍ය ස්වභාවය සම්බන්ධ ආකල්ප 64-71

3.2 අත්‍යුත්පත්තිය හා පරාරෝපණය 71-78

3.3 මිදීම සම්බන්ධ ආකල්ප 78-85

**සිව්වන පරිච්ඡේදය**

සන්සන්දනාත්මක අධ්‍යයනය 90-101

**නිගමනය** 102-103

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 104-108

# සංකේත නිරූපණ

අ.නි - අංගුත්තර නිකාය

ඛු.නි - ඛුද්දක නිකාය

දී.නි - දීඝනිකාය

ම.නි - මජ්ඣිම නිකාය

ම.පා. - මහාවග්ගපාලි

විභං - විභංගප්පකරණය

විශුද්ධි - විශුද්ධිමාර්ගය

සං.නි - සංයුත්ත නිකාය

සු.නි - සුත්තනිපාත

# අන්තර්ගතය

අතෘප්තිය පිළිබඳ බෞද්ධ හා සාදෘෂ්ටිකවාදී විග්‍රහය යන මාතෘකා යටතේ මා කළ අධ්‍යයනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය සඳහා සකස් කෙරුණකි. දර්ශනපති උපාධිය සඳහා පළමුව ප්‍රශ්න පත්‍ර තුනකට පෙනී සිටීමෙන් ද සම්මන්ත්‍රණ පත්‍රිකා තුනක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කර තිබේ. මෙම ස්වාධීන නිබන්ධනය දර්ශනපති උපාධි පරීක්ෂණයට නියමිත අවසාන අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරේ.

මාගේ අධ්‍යයනයට අදාළ විෂය ක්ෂේත්‍ර දෙකකි. එනම් බෞද්ධ දර්ශනය හා සාංදෘෂ්ටිකවාදී දර්ශනයයි.

මෙම නිබන්ධය පරිච්ඡේද හතරකින් සමන්විත වේ. මුල් පරිච්ඡේදයෙන් "අතෘප්ති" සංකල්පයේ පසුබිම සාකච්ඡා කෙරේ. ඒ යටතේ "භගවද් ගීතාව" මූලාශ්‍ර කර ගනිමින් හින්දු ආකල්පද, ජෛන ආගමික හා දාර්ශනික ආකල්පද ඇසුරින් පෙරදිග දර්ශනයේ ඓතිහාසික පසුබිමද, ග්‍රීක හා නූතන දර්ශන ඇසුරින් අපරදිග දාර්ශනික පසුබිම පෙන්වා දී ඇත.

දෙවන පරිච්ඡේදයෙන් "අතෘප්ති" සංකල්පය පිළිබඳ බෞද්ධ ආකල්ප සාකච්ඡා කෙරේ. එහිදී මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ ආකල්ප, දුක හා ආත්ප්තිය, විමුක්තිය පිළිබඳ ආකල්ප යන අංශ තුන සැලකිල්ලට ලක්කර තිබේ.

තෙවන පරිච්ඡේදය අතෘප්තිය පිළිබඳ සාංදෘෂ්ටිකවාදී ආකල්ප විමසීම සඳහා වෙන් කෙරුනි. ඒ පරිච්ඡේදයේද පෙර පරිච්ඡේදයේදී මෙන් මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ ආකල්ප, අතෘප්තිය හා පරාරෝපණය, මිදීම සම්බන්ධ ආකල්ප යන අංශ තුන විමර්ශනයට ලක් කෙරේ.

සිව්වන පරිච්ඡේදයේදී සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කෙරුනි. එහිදී මනුෂ්‍ය ස්වභාවය සම්බන්ධ දර්ශනවාද දෙකේ දැකිය හැකි සමානතා පළමුව විග්‍රහ කර තිබේ. එසේම දුක හා පරාරෝපණය. ශූන්‍යතාව, විමුක්ති මාර්ගය හා මිදීම යනාදී සංකල්පවල ඉස්මතු වූ සමානතාවන්ට වඩා අසමානතා කෙරෙහි අවධානය යොමු කර ඇත.

විශේෂයෙන් සිව්වන පරිච්ඡේදයෙන් මතු කර ගත් කරුණු සැලකිල්ලට ගනිමින් අවසානයේදී නිගමනයකට පැමිණ ඇත.

# හැඳින්වීම

දර්ශනය මානව ඉතිහාසයේ මිනිස් බුද්ධිය මුහුකුරායාමේ ප්‍රතිඵලයක් වශයෙන් බිහිවිය. දාර්ශනික විමර්ශන හැසිරවීමේ ක්‍රියාවලිය පෙරදිග ලෝකයට මෙන්ම අපරදිග ලෝකයටද පොදුය. අප දාර්ශනික යයි කියන ජිවිතය හා ලෝකය පිළිබඳ විකල්පන සාධක දෙකක් මත බිහිවූයේ යැයි සිතිය හැකිය. ඉන් එකක් වන්නේ උරුමයෙන් ආ ආගමික හා ආචාරාත්මක විකල්පයන්ය. අනෙක විද්‍යාත්මක විමර්ශනයන්ය. දර්ශනයේ ඇති විශේෂත්වය නම් කිසියම් ප්‍රමාණයකින් හෝ මේ දෙකම සම්මිශ්‍රණව පැවතිමයි. පෙර අපර දෙදිග දර්ශනවාදයන්හි ඉතිහාසය මෙන්ම නූතන දාර්ශනික පද්ධති දෙස බලනවිට දර්ශනයට නිශ්චිත විෂය සීමාවක් දක්නට නොලැබෙන බව පෙනේ. දර්ශන විෂයේ ස්වරූපය හා කාර්යය ඒ ඒ යුගවලට සාපේක්ෂව වෙනස්වී තිබීමෙන් තවදුරටත් ඒ බව තහවුරුවේ. නමුත් පොදුවේ බලන විට ඥාන විභාගය, ලෝක විභාගය, ආචාර ධර්මය යන අංශ තුන කවර දාර්ශනික පද්ධතියක් වුවද කිසියම් ප්‍රමාණයකින් හෝ අන්තර්ගත වේ. මෙයින් ඥාන විභාගය ලෝක විභාගය කෙරෙහිත් ලෝක විභාගය ආචාර ධර්මය කෙරෙහි බලපායි. විශේෂයෙන් ආචාර විද්‍යාත්මක විමර්ශනවලදී මිනිසාගේ පෞරුෂ ස්වභාවයත් ලෝකයේ මිනිසාට හිමිතැනත් සැලකිල්ලට ගෙන ඇත. පෙර අපර දෙදිග දර්ශනයන් හි විකාශය දෙස බලන විට පෙරදිග ලෝකයේ ආගම හා දර්ශනය එකිනෙකට සම්බන්ධව විකාශය වූ ආකාරයෙන් අපරදිග දර්ශනය විද්‍යාව සමඟ සම්බන්ධවී විකාශය තිබේ. මේ නිසා භාරතිය ආගමික චින්තන හැදෑරීමේදී මූලාශ්‍රයන් වන ආගමික ග්‍රන්ථයන්ම එම දර්ශනයන් හැදෑරීමේදී ද මූලාශ්‍ර ලෙස භාවිත කළ හැකිය. අනෙක් අතට අපරදිග දාර්ශනිකයන් විශ්වය හා මිනිසා තමන් තේරුම් ගත් ආකාරය ලියා තබන්නටද අමතක කොට නැත. විවිධ භාෂාවන්ට පරිවර්තනය වෙමින් මෙතෙක් රැකගෙන විත් තිබෙන මූලික ග්‍රන්ථ මෙන්ම විචාර ග්‍රන්ථද සම්පාදනය වී තිබීම අපේ අධ්‍යයනය පහසු කරයි.

මෙම ගවේෂණයෙහි අරමුණ වන්නේ බෞද්ධ හා සාංදෘෂ්ටිකවාදී දාර්ශනික ආකල්ප ඇසුරින් අතෘප්ති (dissatisfaction) සංකල්පයෙහි ස්වරූපය විමසා බැලීමයි. මෙවැනි සංකල්පීය අධ්‍යයනයක් සඳහා ඉවහල් කර ගත හැකි වැදගත් ඉගැන්වීම් බුදු සමය තුළ මෙන්ම සාංදෘෂ්ටිකවාදය තුළද දක්නට ලැබේ. අතෘප්තියෙහි ස්වරූපය බෞද්ධ හින්දු වැනි ආගමික දාර්ශනික සන්දර්භවලදී සාකච්ඡා කරනවාට වඩා සාංදෘෂ්ටික වාදය හෝ මාක්ස් වාදය වැනි දර්ශනයන් ආශ්‍රයෙන් සාකච්ඡා කිරීම ඉතා අසීරු කාර්යයක් වනවා පමණක් නොව සංකීර්ණ ව්‍යායාමයක් ද වෙයි. විශේෂයෙන් සංදෘෂ්ටික වාදීන් තම අදහස් සාහිත්‍ය ආදී සෞන්දර්යාත්මක නිර්මාණවලින් සංකේතාත්මක ව නිරූපණය කරණ නිසා ඒ සංකීර්ණතාවය තවත් පුළුල් කරයි. විවිධ ආකල්ප හා හැගීම්වලින් සංයුක්ත මිශ්‍රිත තත්වයක් සංක්ෂේපයෙන් දැක්වීම අතෘප්තියෙහි ස්වභාවයයි. සංකල්පයේ පෘථුල භාවය නිසා ඇතැම් විට එය හිස් සහ අර්ථ ව්‍යාකූල වචනයක් බවට වුවද පරිවර්තනය විය හැකිය. නමුත් එයට ප්‍රබල අර්ථයක් ලැබෙන්නේ මෙවැනි වැදගත් සන්දර්භයන් හා සම්බන්ධ කලවිටයි.

අතෘප්තිය යන වචනය යමකින් සෑහීමකට පත් නොවීම යන අර්ථයෙන් යෙදේ. එහි ප්‍රතිභාගය තෘප්තියයි. ඒ අනුව තෘප්තියෙන් තෘප්ත නොවීම අතෘප්තිය ලෙස හැඳින්විය හැකිය. අතෘප්තිකර ස්වභාවය පුද්ගල ස්වීයත්ව (Personality) තත්වයකි. එය තේරුම් ගත හැක්කේ පුද්ගලයාගේ බාහිර ප්‍රකාශ වීම් මගිනි. පුද්ගල චේතනා, හැඟීම්, ක්‍රියාකාරකම් ඒ සඳහා අදාළ කර ගත හැකිය. බෞද්ධ දර්ශනයේ එය "දුක්ඛ" තත්වයේ ලක්ෂණයක් ලෙසත් සාංදෘෂ්ටිකවාදයේ "පරාරෝපණ" බවේ ලක්ෂණය ලෙසත් හැඳින්වේ. බුද්ධදේශනාව ඇසුරින් අතිත්ත සංකල්පය ගැන කතා කිරීම නිෂ්ඵල ව්‍යායාමක් නොවේ. නමුත් සාංදෘෂ්ටිකවාදය ඇසුරින් අතෘප්ති සංකල්පය ගැන කතා කළ හැකිද? සාංදෘෂ්ටිකවාදි සාහිත්‍ය තුල එම පරිභාෂික වචනය සෙවීම නිෂ්ඵල ව්‍යායාමයක් විය හැකිය. එහිලා වඩාත් යෝග්‍ය වන්නේ අතෘප්ති සංකල්පය තේරුම් ගැනීමත් ඒ සමාන සංදෘෂ්ටික ඉගැන්වීම් සෙවීමත්ය.

අතෘප්තිය බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් අවබෝධ කර ගැනීමට එය දුක්ඛ සංකල්පය සමග ගැලපිය යුතුය. දුක්ඛ යන පාලි වචනයේ කනගාටුව, අසන්තෝෂය, හැඬීම, වැළපීම, නොසතුට, අසහනය වැනි මතුපිට අර්ථ ඇත. බුදුරදුන් විසින් එවැනි සරල වේදනා මාත්‍රයක් අදහස්කොට දුක්ඛ සත්‍ය දේශනා නොකල බව පැහැදිලිය. මෙහිදී අසරණ භාවය, අතෘප්තිකර භාවය, අපරිපූර්ණත්වය වැනි වචන වලින් එය වඩාත් තේරුම් ගත හැකිය. මිනිසාට උරුම වී ඇති මේ සාංසාරික ජීවිතය දුකකි. ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදියෙන් අත්මිදීමට නොහැකිව සිටින බැවින් පැවැත්ම අතෘප්තිකර වේ. එවැනි තත්ත්වයන්ගෙන් මිදීමට මිනිසා කැමැතිය. එහෙත් ඒ කැමැති දෙය නොලැබෙන බැවින් එය දුකකි. එසේම මිනිසා ලබන වින්දනයන් සැප ලෙස හඟී ගියද ඒ සියල්ල තාවකාලිකය. මෙලොව ජීවිතයේදී දිළිදුව ජීවත් වීමට සිදුවී තිබීමෙන්ද මිනිසා අත්විඳින්නේ දුකකි. බෞද්ධ චතුරාර්ය සත්‍යයේ දුක්ඛ සත්‍යය සහ ත්‍රිලක්ෂණ දේශනාවෙන් බුදු සමයේ දක්වන දුක්ඛයේ ස්වභාවය තේරුම් ගත හැකිය. පටිච්චසමුප්පාද ධර්මයෙන් ලොව සියල්ල හේතු ප්‍රත්‍යයන් ගෙන් යුක්ත බව හැඳින්වේ. හේතු ප්‍රත්‍යයට අනුව දුක්ඛ සංකල්පය දෙස බලන විට එයට හේතුව තණ්හාවයි. මේ අනුව අතෘප්තිය බෞද්ධ දර්ශනය තුළින් තේරුම් ගැනීමේදී පටිච්චසමුප්පාදය, චතුරාර්ය සත්‍යය, ත්‍රිලක්ෂණය වැනි මූලික බුද්ධ දේශනාවන් සැලකිල්ලට ගත යුතුය.

අතෘප්තිය පිළිබඳ සාංදෘෂ්ටිකවාදි විග්‍රහය තේරුම් ගැනීමට නම් අතෘප්තිය සාංදෘෂ්ටිකවාදී පරාරෝපණය සමග ගළපා බැලිය යුතුය. මිනිස් ජීවිතයේ හුදෙකලා බව, තනිකම, අන්‍ය බව, නුහුරු බව, විදේශික බව, දුරස්ථ බව, අතෘප්තිකර බව, වැනි තත්තව පරාරෝපණ සංකල්පයෙන් තේරුම් කිරීමට සාංදෘෂ්ටිකවාදීන් උත්සාහ ගෙන තිබේ. මෙවැනි තත්ත්වයන්ට මිනිසාට මුහුණදීමට සිදුවන්නේ අසහනයට ඉච්ජාභංගත්වයට පත්වන නිසාය. අසහනය හා ඉච්ජාභංගත්වය පරාරෝපණයේ ප්‍රතිඵලයන්ය. පරාරෝපණ ගැටලුව දෙස විවිධ දෘෂ්ටිකෝණවලින් බලා තිබේ. පරාරෝපණ වීමේ හේතුව

ඒ ඒ දෘෂ්ටිකෝණවලට අනුව පැහැදිලි කරන්නට උත්සාහ ගෙන තිබෙන්නේ මේ නිසාය. මාක්ස්වාදීන්ට අනුව පරාරෝපණයේ හේතුව ආර්ථිකයයි, හෙවත් ධනවාදී නිෂ්පාදන රටාවයි. තවත් සමහරු එය යාන්ත්‍රික කරණයේ ප්‍රතිඵලයක් ලෙස දකිති. සමාජ විද්‍යාඥයින් සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙනුත් මනෝවිද්‍යාඥයින් මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙනුත් එය තේරුම් කිරීමට ප්‍රයත්න දරා තිබේ. මෙසේ බලන විට පරාරෝපණය යන්නෙහි තේරුම් ලේඛකයාගෙන් ලේඛකයාට වෙනස් වෙයි. බොහෝ විට එකම ලේඛකයකු විසින් දෙන තේරුම් ද ඔහුගේ මනෝභාවය අනුව වෙනස් වෙයි. මේ නිසාම පරාරෝපණය අනේකාර්ථ ඇති නොපැහැදිලි සංකල්පයක් වී තිබේ.

කෙසේ වුවද පරාරෝපණයේ ස්වරූපය ඇතැම් විට ඉතා හොඳින් ප්‍රකාශයට පත් වී ඇත්තේ ලෝකයේ කිසි ආවශ්‍යක අර්ථයක් ඇතැයි නොපිළිගන්නා සාංදෘෂ්ටිකවාදය තුළිනි. ඔවුන්ට අනුව මිනිස් ජීවිතය නිසග අරමුණක් නොමැති විකාරයකි. අර්ථය වූකලි ජීවත් වීමේ ක්‍රියාදාමයේදී මිනිසුන් විසින් කෘත්‍රිමව නිපදවිය යුක්තකි.

ඉන්බර්න් නමැති ලේඛකයා දක්වන අන්දමට මිනිස් පැවැත්ම වූකලි තමන් අවට (අනික් පැත්තෙහි) තේරුම් ගත නොහැකි හිස් බවකින් පාළුවකින් යුතු භෞතික ලෝකයක ගතකරන කෙටි කාලයකි. මිනිසා වෙනුවෙන් සකස්නොවුණු මිනිසාට නුසුදුසු හා ඔහුගේ ඉරණම පිළිබඳව නොසැලකිලිමත් ලෝකයක් තුළට තමන් වීසිකර දමනු ලැබ තිබෙන බවට හැඟීමක් මිනිසාගේ මනස තුළ ඇතිවේ. සාංදෘෂ්ටික දාර්ශනික ගාබ්‍රියෙල් මාෂෙල් පවසන්නේ කාර්මික හා නිෂ්පාදනමය සමාජයක ජීවත් වීම නිසා මිනිසාගේ මිනිස්බව නැතිවීගොස් තිබෙන බවයි. සාංදෘෂ්ටිකවාදීන්ට අනුව විද්‍යාව වනාහි මිනිස් පුද්ගල භාවය, මිනිස් නිදහස සහ මිනිස් ක්‍රියාකාරීත්වය නසන ආයුධයයි. වර්තමාන ලෝකය කාර්මිකරණය (Industrialization) නාගරීකරණය (Urbanization) නිෂ්පාදනයේ හා පරිභෝජනයේ අන්තර්ජාතියකරණය (Internationalization) සහ ගෝලියකරණය (Globalization) හේතුවෙන් නවීකරණය (Modernization) වී ඇත. කාර්මිකරණය හා නාගරීකරණය හේතුවෙන් සිදුවූයේ යන්ත්‍රාශ්‍රිත ජීවන සංස්කෘතියක් බිහිවීමයි. එක් පැත්තකින් යන්ත්‍රාශ්‍රිත ජීවන සංස්කෘතිය තුළ මානවයා යන්ත්‍රවල වහලෙකුගේ තත්වයට පත්ව ඇත. අනෙක් පැත්තෙන් ආත්මාර්ථකාමී ස්වයං සීමිත ජීවන සංස්කෘතියකට හුරුවීම තුළ හුදෙකලා ජීවිත ගතකරයි. විද්‍යාව විසින් මිනිසාට ස්වභාව ධර්මය පාලනය කිරීමේ හැකියාව ලබාදුන්නද මිනිස් ස්වභාවයන් පාලනය කිරීමේ හැකියාව ලබාදී නැත. සන්නිවේදන තාක්ෂණය මගින් සිදුකෙරෙන සංස්කෘතික විපර්යාස, නිෂ්පාදනයේ හා පරිභොජනයේ විශ්වීයකරණය නූතන තාක්ෂණික විද්‍යාවේ ප්‍රතිඵලයන් ය. ගෝලියකරණය හේතුවෙන් වර්තමානයේ ගොඩ නැගී තිබෙන්නේ බහු සංස්කෘතික ලෝකයකි. මෙම බහු සංස්කෘතික ලෝකයේ පැවති දේශීය සම්ප්‍රදායන් දුබල වී ගොස් පාරිභොගික ප්‍රජාව විශේෂයෙන් තරුණ තරුණියෝ තමන්ටම ආවේණික දේශපාලන, ආගමික හෝ ජාතික සංකල්ප ගැන නොතකා වෙනත් සමාජ වලට ගැලපෙන විජාතිය තොරතුරු හා විලාසිතා පදනම් කරගෙන නවතම හැසිරීම් රටාවක් ගොඩනගා ගනිති. විශේෂයෙන්ම මිනිසා සිදුවන්නේ අධිකාරීත්වයක් හා පූර්ණත්වයක්

ඇතිව කෙරෙන ප්‍රකාශ වෙනුවට උධෘත අනුකරණහා ප්‍රතිරාව සුලභ වීමයි. මෙවැනි තත්ත්වයක් මත සිදුවන්නේ මානවයා තව දුරටත් ඉච්ඡාභංගත්වයට හා අසහනයට පත්වීමයි. අසහනයට "ශිෂ්ටාචාරටයේ ව්‍යාධිය" (disease of civilization) යයි කියනු ලැබේ. මේ ව්‍යාධිය මත මානවයා ස්වකිය ජීවිතය සම්බන්ධයෙන් දකිනුයේ අර්ථ ශුන්‍ය බවකි. මෙසේ පැහැදිලි කිරීමට තරමක් අපහසු ජීවිතයේ අවශ්‍යයෙන්ම දක්නට ඇති අර්ථ ශුන්‍ය බව, හිස් බව පරාරෝපණ සංකල්පයෙන් තේරුම් කිරීමට සංදෘෂ්ඨිකවාදීන් උත්සාහ දරා තිබේ.

එසේම මෙහිදී මිනිස් පැවැත්ම සම්බන්ධ සංදෘෂ්ටිකවාදී ආකල්පයය තේරුම් ගැනිම ද වැදගත්ය. "පැවැත්ම සාරයට වඩා මුලික වන්නේය." (Existence Precedes Essence) යන්න ඔවුන්ගේ මුඛ්‍ය තේමාවයි. ඕනෑම දෙයක පැවැත්මකින් තොරව සාරයක් හට නොගනි. පැවැත්ම තේරුම් ගත හැක්කේ මිනිසාගේ ක්‍රියාකාරීත්වයෙනි. එය මිනිසා තුලින්ම තේරුම් ගත යුතුය. තවද එය තේරුම් ගත යුත්තේ ඔහුගේ ම බලාපොරොත්තුවලිනි. ඇතැම් විට එය නියම පැවැත්ම නොවිය හැකිය. නිට්ෂේ දක්වන ආකාරයට ලෝකයේ ඇති සෑම දෙයකින්ම අවසානයේ ප්‍රයෝජන ගන්නේ මිනිසාය. එසේනම් වැදගත් වන්නේද මිනිසාමය. එහෙත් අද මිනිසා නොවැදගත් ඒකකයක් වී ඇත. එයට හේතුව පුද්ගලික මිනිසාට වඩා සමාජය වැදගත් කොට සැලකීමයි. එහිදී සිදුවන්නේ පුද්ගලික මිනිසා සමාජය උදෙසා පරාරෝපණය වීමයි. මේ අනුව බලන විට පුද්ගලික මිනිසාගේ ආශා බලාපොරොත්තුවලට එරෙහිව සමාජය නැගිසිටි එවිට මිනිසා ඔහුගේ ඉටු නොවන බලාපොරොත්තුවලට පරාරෝපණය වෙයි.

අතෘජතිය සාංදෘෂ්ටිවාදී පරාරෝපණය සංකල්පයෙන් තේරුම් ගැනීමේදී සාංදෘෂ්ටිකවාදී සෞන්දර්යාත්මක නිර්මාණ වෙතට දයා යුතුය. මිනිස් පැවැත්මේ ඇති සංකිර්ණ තත්වයන් ඔවුන් සෞන්දර්යාත්මක නිර්මාණවලින් සංකේතාත්මකව නිරූපණය කරඇත. එනම් නවකතා, කෙටිකතා, නාට්‍ය වැනි නිර්මාණ වලිනි. ඩොස්ටොවුස්කි ගේ "කැරමසොෆ් සහෝදරයෝ" ඇල්බෙයා කැමුගේ "පිටස්තරයා" හා "මහාමාරිය" හර්මන් හෙසගේ 'සිද්ධාර්ථ' වැනි නවකතා, සැමුවෙල් බෙකට්ගේ "ගොඩ උන්නැහේ එනකං" යන නාට්‍ය එවැනි අතිවිශිෂ්ට නිර්මාණයන්ගෙන් කිපයකි. මීට අමතරව සාංදෘෂ්ටිකවාදය සම්බන්ධයෙන්ම රචනා වී තිබෙන කෘති කියවීමෙන් පරාරෝපණයේ ස්වභාවය:හාඑයින් මිදීම සම්බන්ද තොරතුරු ලබාගත හැකිය. මෙහිදී විශේෂයෙන් ජින් පෝල් සාත්රේ ගේ කෘතින් සැළකිල්ලට ගත හැකිය. නමුත් සාංදෘෂ්ටික අදහස් එලිදක්වන කලාත්මක නිර්මාණ මෙන්ම සාංදෘෂ්ටිකවාදය සම්බන්ධයෙන් සකස්කරන ලද බොහෝ කෘති ප්‍රංශ ජර්මන් වැනි භාෂාවන්ගෙන් පලවී තිබීම ගැටලුවකි. ඒවායේ ඉංග්‍රිසි පරිවර්තනයන් ඇතත් ඇතැම් ඒවා සොයා ගැනිම අපහසුය. සාංදෘෂ්ටිකවාදී සාහිත්‍යයේ සමහර ඒවායේ සිංහල පරිවර්තනයන් පමණක් පාවිච්චි කරන්නට සිදුවිය.

මෙතැන් සිට මෙම නිබන්ධයේ පරිච්ඡේදවල අන්තර්ගතවන කරුණු පිළිබඳ හැඳින්වීමක් කිරීම කෙරෙහි අවධානය යොමුකරමි. ප්‍රථම පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරෙන්නේ අතෘප්ති සංකල්පයේ ඓතිහාසික පසුබිමයි. එහිදී හින්දු භගවද් ගීතාව පාදක කර ගනිමින් ඒ සම්බන්ධ ප්‍රවේශයකට පැමිණීමට අපේක්ෂා කරමි. එසේම ජෛන දාර්ශනික ආකල්ප කෙරෙහිද අවධානය යොමු කෙරේ. භගවද් ගීතාවේ මෙන්ම ජෛන දර්ශනයේද දුක, තෘෂ්ණාව, සංසාරය, විමුක්තිය, පිළිබඳ බුදු සමයට සමාන ඉගැන්වීම් දැකිය හැකිය. ගීතාවට අනුව පුද්ගලයා ක්‍රියාවන් සඳහා මෙහෙය වනු ලබන්නේ සත්ව, රජස් සහ තමස් යන ගුණත්‍රය විසිනි. බෞද්ධ ආකල්ප වන්නේ ලෝභ, දෝස, මෝහ, යන අවිඥාතික ප්‍රේරණයන් විසින් පුද්ගලයා මෙහෙය වන බවයි. සසරට බැඳීම සම්බන්ධව බුදු සමයේ කෙරෙණ හේතුඵල වාදී විග්‍රහයට සමාන විග්‍රහයක් ගීතාවේද එයි. විමුක්තිය සඳහා ආත්මාවබෝධයෙහි වැදගත්කම මෙම දර්ශනවාදයන් තුනෙන්ම අවධාරණය කරයි. උපේක්ෂාව ආත්මාවබෝධයේ සළකුණ වන අතර චිත්ත දමනය ඒ සඳහා හේතුවෙයි. මෙවැනි කරුණු සැළකිල්ලට ගනිමින් අතෘප්ති සංකල්පයේ පසුබිම සාකච්ඡා කිරීමට අපේක්ෂා කරමි. අපරදිග දර්ශන ඉතිහාසයේ මෙවැනි සංකල්පයක් පිළිබඳව කෙරෙන විග්‍රහයන් ගැන සෙවීම නිශ්ඵල ව්‍යායාමයක් විය හැකිය. එහෙත් මිනිසා ඉන්ද්‍රියන් පිණවීමෙන් සොයන සැපතට වඩා ආධ්‍යාත්මික සැපත උසස් වන බවට ඔවුහුද එකඟ වෙති. එහිදී සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්, එපිකියුරියානුවාදය, ස්ටොයික්වාදය, සයිරේනික වාදය, ස්පිනෝසා වැනි දාර්ශනිකයින්ගේ දර්ශනවාදයන් සැලකිල්ලට ගනිමි.

දෙවන පරිච්ඡේදයෙන් අතෘප්තිය පිළිබඳ බෞද්ධ ආකල්ප විමසීමට අපේක්ෂා කරමි. මානව කේන්ද්‍රීය දර්ශනයක් වන බුදු සමය ලෞකික හා ලෝකෝත්තර සුභ සිද්ධිය අරමුණුකර ගනිමින් දේශිතය. බුදු සමයට අනුව අතෘප්තිය සාංසාරික ජීවිතයේ ගැටලු මතු කරන අතර විමුක්තියට ද බාධාවකි. මෙම පරිච්ඡේදයේදී පුද්ගල ස්වභාවය පිළිබඳ බෞද්ධ ආකල්ප, දුක්ඛ සංකල්පයෙන් පැහැදිලි කෙරෙන අතෘප්තියේ ස්වභාවය හා විමුක්තිය සම්බන්ධ බෞද්ධ ආකල්ප යන අංශ තුන සැලකිල්ලට ගනිමින් අතෘප්තියේ ස්වභාවය තේරුම් ගැනීමට අපේක්ෂා කරමි. මෙම අධ්‍යයනයේදී සුවිශේෂ වශයෙන් රට්ඨපාල සූත්‍රය, මහාතණ්හාසංඛය සූත්‍රය, රථවිනිත සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය, ධම්මචක්කප්පවත්වන සූත්‍රය, සච්චවිභංගය, සච්චවිභංග සූත්‍රය වැනි සූත්‍ර දේශනාවන් මෙන්ම ධම්මපදය, විශුද්ධි මාර්ගය හා අටුවා ග්‍රන්ථ ද මූලාශ්‍ර වශයෙන් භාවිතා කළෙමි.

තෙවන පරිච්ඡේදය අතෘප්තිය පිළිබඳ සාංදෘෂ්ටිකවාදී ආකල්ප විමසීමට වෙන් කෙරේ. විසිවන සියවස බටහිර දර්ශනයේ සුවිශේෂ කාල පරිච්ඡේදයකි. නවීන ලෝකයට බලපාන තාර්කික යථානුභූතවාදය (Logical Positivism), තාර්කික විභජ්ජවාදය (Logical Analysis), භාෂාමය දර්ශනය (Linguistic Philosophy), මාක්ස්වාදය (Marxism) වැනි දර්ශනවාද රැසක් බිහිවීම එයට හේතුවයි. මේවායින් සාංදෘෂ්ටිකවාදය හා මාක්ස්වාදය මිනිසා පිළිබඳ දර්ශනයන්ය. මාක්ස්වාදය පොදු සමාජයක් ගැන අවධානය යොමුකල අතර සාංදෘෂ්ටික වාදයෙන් පුද්ගලික මිනිසාගේ පැවැත්ම අවධාරණය කරයි. තම පැවැත්ම

නිසාම මිනිසා පුද්ගලයකු වශයෙනුත් සමාජයේ අන්‍යයන් අතර පැවැත්මෙන් සමාජ පුද්ගලයකු වශයෙනුත් ගෙන මිනිසා දෙස සාපේක්ෂ හා නිරාපේක්ෂව බැලීමේ ප්‍රවණතාවයක් සාංදෘෂ්ටිකවාදයෙහි දකින්නට ලැබේ. සාංදෘෂ්ටික වාදයට අනුව අතෘප්තිය පරාරෝපණ බවේ ලක්ෂණයකි. දෙවන පරිච්ඡේදයේ දී මෙන් මෙම පරිච්ඡේදයේද පුද්ගල ස්වභාවය පිළිබඳ සාංදෘෂ්ටිකවාදී ආකල්ප, පරාරෝපණයෙන් හෙළිවන අතෘප්තියේ ස්වභාවය, මිදීම සම්බන්ධයෙන් මතු කර ගත හැකි ආකල්ප යන අංශ තුන සැළකිල්ලට ගෙන ඇත. සාංදෘෂ්ඨිකවාදය මිනිස් පැවැත්මේ ඇති අර්ථය තේරුම් කිරීමේ ව්‍යායාමයක් වන හෙයින් මිදීම සම්බන්ධ ආකල්ප සෙවීම නිෂ්ඵල ව්‍යායාමයක් වනු ඇතැයි සිතෙන්නට පුළුවන. එහෙත් සාංදෘෂ්ටිවාදී දාර්ශනිකයින් තැනින් තැන මිදීම සම්බන්ධවද කතා කර ඇති බැවින් මගේ ව්‍යායාමය නිශ්ඵල නොවනු ඇත. මානුෂවාදී හා සාංදෘෂ්ටිකවාදී මනෝවිද්‍යාවද මගේ අධ්‍යයනය සම්බන්ධයෙන් අදාළ කර ගැනීමට අපේක්ෂා කරමි. මෙහිදී සෝරේන් කියකිගාඩ්, ෂොපන්හවර්, නීට්ෂේ, ජීන් - පෝල් සාන්රේ, ඇල්බෙයාකැමු වැනි දාර්ශනියකයන් කෙරෙහි විශේෂ වශයෙන් අවධානය යොමු කළ යුතුය. පුද්ගල ස්වභාය හා මානසික ගැටලු මෙන්ම විසඳුම් තේරුම් ගැනීමේ දී ඒබ්‍රහම් මාස්ලෝ, කාර්ල් රොජර්ස්, වික්ටර් ෆ්‍රැන්කල්, රොලෝ මේ වැනි මානුෂවාදී හා සාංදෘෂ්ඨික මනෝවිද්‍යාඥයින්ගේ අදහස් අදාළ කර ගත හැකිය.

සිව්වන පර්ච්ඡේදය සංසන්දනාත්මක අධ්‍යයනයකි. එහිදී මුල් බුදුසමයේ ත්‍රි-ලක්ෂණය සාංදෘෂ්ටිකවාදී ශූන්‍යතාව (nihilism) සමගත්, මිදීම සම්බන්ධ සාංදෘෂ්ටිකවාදී ආකල්ප බෞද්ධ නිර්වානගාමී ප්‍රතිපදාවේ අනුපූර්ව ප්‍රතිපදාවන් ලෙස හැඳින්විය හැකි අල්පේච්ඡතාව, මෛත්‍රිය, භාවනාව වැනි ප්‍රතිපදාවන් සමග සැසඳීමට අපේක්ෂා කරමි. විමුක්ති සැපත දෙස බලන විට බුදුසමයේ සැපත ලෞකික හා ලෝකෝත්තර වශයෙන් ප්‍රභේද වුවද සංදෘෂ්ඨිකවාදීන් එවැනි ලෝකෝත්තර සැපතක් කෙරෙහි අවධානය යොමු කර නැත. එහෙත් මිනිස් ස්වභාවය සම්බන්ධයෙන් සලකන විට බුදු සමයේ මෙන් ගැඹුරු තේරුම් ගැනීමක් නොමැති වුවද කියකිගාඩ්, ෂොපන් හවර්, ඒබ්‍රහම් මාස්ලෝ වැනි අයගේ ආකල්ප හා බුදුසමය යම් බඳු සාම්‍යත්වයක් දැකිය හැකිය. බුදුන්වහන්සේ මෙන් මේ දාර්ශනිකයෝ විවිධ උපමාරූපක යොදා ගනිමින් මිනිසාගේ අතෘප්තිකර ස්වභාවය පැහැදිලි කිරීමට උත්සාහ ගත්හ.

මගේ අධ්‍යයනය මෙසේ පරිච්ඡේද හතරකට පමණක් සීමා කළේ නිබන්ධ සැලැස්මේ දැක්වූ සමහර අංශ අධ්‍යයනය සම්බන්ධයෙන් නොවැදගත් යයි අධ්‍යයනය කරගෙන යද්දී හැගිගිය හෙයිනි. ඉහත පරිච්ඡේදවල සාකච්ඡා කළ කරුණු සැලකිල්ලට ගනිමින් නිගමනයට පැමිණීමට උත්සාහ කළෙමි.

## ඓතිහාසික පසුබිම

අධ්‍යයනයට ප්‍රවේශයක් වශයෙන් පළමු පරිච්ඡේදය පසුබිම් විග්‍රහයක් සඳහා වෙන් කර ඇත. මෙහිදී මූලිකව පෙරදිග හින්දු ආගමේ පූජනීය ග්‍රන්ථයක් වන භගවද් ගීතාව ආශ්‍රයෙන් අත්‍යුප්තියේ ස්වභාව තේරුම් ගැනීමට අපේක්ෂා කරන අතර දෙවනුව අපරදිග දර්ශන ඉතිහාසයේ එවැනි සංකල්පයක් ගැන අවධානය යොමු කර තිබෙන්නේ ද යන්න විමසා බැලීමට අපේක්ෂා කෙරේ.

ශත වර්ෂ ගණනාවක් තිස්සේ මානව අත්දැකීම් හා බාහිර ලෝකය පදනම් කර ගෙන පෙරදිග දාර්ශනික චින්තාවන් වර්ධනය වී ඇත. මිනිසා හා විශ්වය සම්බන්ධව විද්‍යාත්මක පසුබිමක් මත ගොඩ නැගී ඇති අපරදිග ඥානය මෙන් නොව භාරතීයයෝ ස්වකීය ආධ්‍යාත්මය තුළින් අවබෝධ කරගත් සත්‍යයන් මත විශ්වය සම්බන්ධ ඥාන ගොඩනැගූහ. බොහෝවිට අපරදිග දාර්ශනිකයන් යථාර්ථය, සත්‍ය, සම්බන්ධ මත ප්‍රකාශ කිරීම පමණක් කළද, භාරතීය දාර්ශනිකයෝ මත ප්‍රකාශ කිරීමෙන් නොනැවතී යථාර්ථය අවබෝධ කරගත හැකි බවත් ඒ සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපදාවන් ගැනත් අවධානය යොමු කළහ.

## 1.1 භගවද් ගීතාව

භාරතීය දර්ශනයෙහි සම්භාවනීය කෘතියක් වන භගවත් ගීතාව කෙරෙහි අවධානය යොමු කළහොත් එහි ප්‍රධාන වැදගත්කම වන්නේ එය භාරතීය චින්තනයේ ඉතා අනර්ඝ සංශ්ලේෂණයක් ලෙස හැඳින්විය හැකි වීමයි. වේද, උපනිෂද්, සාංඛ්‍ය, යෝග, වේදාන්ත, බෞද්ධ යන මේ දර්ශන සම්ප්‍රදායන් රාශියක පල කෙරුණු ආධ්‍යාත්මික ජීවිතය හා සදාචාර ජීවිතය පිළිබඳව වැදගත් අදහස්වල සංශ්ලේෂණයක් කිරීමට භගවද් ගීතාව උත්සාහ ගෙන ඇති බව පෙනේ.[1] එසේම මෙය භාරතීය දර්ශනයේ සම්ප්‍රදායානුකූල චින්තනය නියෝජනය කරන්නකි. එනම් වෛදික සම්ප්‍රදායෙන් ඉවත් නොවුණු ආගමික කෘතියකි. ඇම්. හිරියන්න සඳහන් කරන්නේ භගවත් ගීතාව ජනප්‍රියත්වය අතින් ඉන්දීය චින්තාවලෝකයේ අන් කිසිවකට දෙවැනි නොවන ග්‍රන්ථය බවයි. එසේම මෙය පරම්පරා ගණනක්ම ඉන්දීය ස්ත්‍රී පුරුෂයන් කුල්මත් කළ වීර කාව්‍යයක කොටසකි.[2] මෙහි තිබෙන තවත් විශේෂත්වයක් වන්නේ ගීතාවේ දාර්ශනික පදනම උපනිෂදයෙන් ගෙන තිබීමයි.

ක්‍රි.පූ. 4 වන සියවසේදී රචිත යැයි සැලකෙන ලෝකයේ දැනට ලියවී ඇති කෘති අතුරින් විශාලතම කෘතිය වන මහාභාරතය නම් ග්‍රන්ථයේ එන කොටසක් ලෙස භගවද් ගීතාව හැඳින්විය හැකිය. මේ කෘතිය අයත්වන කාලය බෙහෙවින්ම මතභේදයට තුඩුදී ඇත. බොහෝ දෙනාගේ පිළිගැනීම අනුව නම් මෙය ක්‍රි.පූ 200දී පමණ රචනා වූවකි.[3] මෙය පාර්ශ්ව දෙකක් අතර ඇති වූ යුද්ධයක් පසුබිම් කර ගෙන ලියවී ඇත. එනම් කෞරව වංශික ගෝත්‍ර ශාඛා දෙකක් අතර සූදු ක්‍රීඩාවක යුක්තිය සම්බන්ධව වූ යුද්ධයකි. යුද්ධයක් පසුබිම් කරගෙන මිනිස් ආධ්‍යාත්මික ජීවිතයට කිසියම් ආදර්ශයක් ලබාදීමට මින් උත්සාහ ගෙන ඇත. රාධා ක්‍රිෂ්ණන්ට අනුව නම් මෙයින් හින්දු දර්ශනය, ආගම හා සදාචාරය ඉගැන්වේ.[4] ප්‍රධාන වශයෙන් මෙහි

ඉගැන්වෙන්නේ කර්ම යෝගයයි. කර්මය නම් කටයුත්ත හෙවත් කළ යුතු දෙයයි. කටයුත්ත කරන්නා ඒ කෙරෙහි අමුතු සැලකිල්ලක් හෝ බැඳීමක් නොදක්වා මුහුණ දෙන්නට වන කෙබඳු දෙයක් ගැන වුවද සම සිතින් එය කළ යුතුය. එහිදී ක්‍රියාවේ ඵලය කෙරෙහි ඇල්මක් නොදක්වා ඒ ඒ අවස්ථාවේදී තමන් විසින් කළ යුතු දෙය කළ යුතුය.[5]

තවදුරටත් භගවද් ගීතාවේ පසුබිම කෙරෙහි අවධානය යොමු කළොත් එය භාරතීය චින්තන ඉතිහාසයේ ප්‍රධාන චින්තන ධාරා දෙකක් නියෝජනය කරන බව පෙනේ. ඒවායින් පළමුවැන්න වෛදික චින්තනධාරාවයි. මෙය චතුර්වේදයෙන් ආරම්භ වී බ්‍රාහ්මණ, ආරණ්‍යක හා උපනිෂද් ආදී වශයෙන් වර්ධනය වී යයි. දෙවැන්න අවෛදික චින්තනධාරාවයි. අවෛදික චින්තනයන්ට බෙහෙවින්ම මුල් වූයේ භාරතයේ වර්ධනය වූ ශ්‍රමණ චින්තනය සහ සංස්කෘතියයි. මෙයින් කැපී පෙනෙන ශ්‍රමණ ශාස්තෘන් ලෙස ජෛන මහාවීර සහ බුදුන් වහන්සේ හැඳින්විය හැකිය. භගවද් ගීතාව වෛදික සම්ප්‍රදායට ප්‍රමුඛත්වය දී තිබෙන බව සිතිය හැකි වුවද[6] එහි ඉහත දැක්වූ දෙපක්ෂයම නියෝජනය කරන බව පෙනේ.

අපගේ අධ්‍යයනය සම්බන්ධව භගවද් ගීතාවේ ඇති වැදගත්කම සලකා බලනවිට ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ භාරතයේ ඇතිවුණු සම්ප්‍රදායන් දෙකක් එක්තැන් කිරීමට ගෙන තිබෙන උත්සාහය වැදගත්ය. ඉන් එකක් වන්නේ නෛෂ්ක්‍රම්‍ය සම්ප්‍රදායයි. ආධ්‍යාත්මික ජීවිතයේ ප්‍රතිඵල ලැබීමට නම් ලෞකික බැඳීම්වලින් මිදිය යුතුය යන්න ඉන් ගම්‍ය වේ. මේ අදහස ශ්‍රමණ සම්ප්‍රදායන්වල ප්‍රබලව දැකිය හැකිය. එයිනුත් ජෛන සමයේ සහ බුදු සමයේ විශේෂයෙන් දකින්නට ලැබේ. ඒ අනුව ලෞකික ජීවිතයට අයත් ඇතැම් වගකීම් සහ බැඳීම්වලින් මිදීම ආධ්‍යාත්මික අරමුණු සඵල කර ගැනීමට පූර්ව අවශ්‍යතාවක් හැටියට බෞද්ධ, ජෛන වැනි සම්ප්‍රදායන්හි සළකා ඇත.

දෙවන පිරිස භෞතිකවාදී ආකල්ප දැරූ අයයි. මෙකී සම්ප්‍රදායට අනුව මිනිසා යනු භෞතික ධර්ම පද්ධතියකි. මිනිස් ජීවිතය මරණයෙන් කෙළවර වන බව මේ අයගේ පිළිගැනීම වේ. භෞතිකවාදී ආකල්ප දැරූ අය චාර්වාකයින් ලෙස හැඳින්වේ. චාර්වාක සම්ප්‍රදායට අනුව මේ ජීවිතය තුළ සැප ලබාගැනීම මිනිසාගේ එකම අරමුණයි. ඒ අනුව මිනිස් උත්සාහයේ අර්ථය කාම හෙවත් කාමුක සැපත හිමි කර ගැනීමට හෝ අර්ථ හෙවත් ඒ සඳහා මාර්ග සලසා ගැනීමට සීමා වෙයි.[7] අජිතකේශකම්බලි පැරණි භෞතික වාදිකයකු ලෙස හැඳින්වේ. මොහුගේ ඉගැන්වීමට අනුව සත්වයා සකස් වී ඇත්තේ සතර මහාභූත කොටස් වලිනි. මරණයේදී සතර මහා භූත කොටස් බාහිර ලෝකයේ සතර මහා භූතයන්ටම එකතු වේ. ඉන් සියල්ල නිමවේ. බෞද්ධ විග්‍රහයට අනුව නම් උසස් ජීවන ක්‍රමය වන්නේ බ්‍රහ්මචරියා වාසයයි. එම බෞද්ධ ආකල්පය අනුව භෞතිකවාදී පිරිස උත්තරීතර යහපත් ජීවන සංකල්පයක් නොතිබුණ අයයි.

මේ අනුව බලනවිට ආධ්‍යාත්මික ජීවිතය සම්බන්ධයෙන් එක් පැත්තකින් මරණයෙන් ජීවිතය කෙළවර වන හෙයින් මිනිස් ජීවන මාර්ගය සකස්විය යුත්තේ ඒ ජීවත්වන කාලය තුළ හැකි පමණ තමන්ගේ ආශාවන් ඉටුකර ගැනීම සඳහාය යන ජීවන දර්ශනයක් ඉදිරිපත් කළ

පිරිසකුත් ඊට විරුද්ධව මිනිස් ජීවිතයේ සතුට භෞතික අවශ්‍යතාවයක් සහ ආශාවන් සම්පූර්ණ කර ගැනිම මත පමණක් රඳානොපවතින බව පිළිගත් පිරිසකුත් දැකිය හැකිය. මෙසේ බලන විට මිනිස් ජීවිතයේ ලබන සතුට ආධ්‍යාත්මික හා භෞතික වශයෙන් ප්‍රභේද වෙයි. ආධ්‍යාත්මික සතුට උතුම් පරමාර්ථයක් ලෙස සැලකූ අය කාමයන් හා ආශාවන් තෘප්ත කිරීම හා සම්බන්ධ ජීවිතය පහත් මට්ටමක සලකා ඇත. කාමය විසින් ඇති කරන සතුට හීන වූ සතුටකි. ඒ නිසා නිවැරදි දැක්මකින් බලනවිට කාමයන් දුක් සහිතය. එයට හේතුවන්නේ එසේ ලබන සතුට තාවකාලික සතුටක් වීමයි. මේ නිසා ඉන්ද්‍රිය බද්ධ සතුට ඉවත දමා ඊට වඩා උතුම් සතුටක් සොයන්නට මේ අය පෙළඹී ඇත. එසේ පෙළඹුණ ඔවුන් ඉන්ද්‍රිය බද්ධ සතුට සෙවීම වෙනුවට මනසේ ශික්ෂණයෙන් ලබන සතුට කෙරෙහි උත්සුක වූ බව පෙනේ. එහිදී හැඟී ගියේ සමාජ ජීවිතය ඇසුරින් මිනිසා සොයන්නේ ඉන්ද්‍රිය පිනවීමෙන් ලබන සතුට බවයි. මෙහිදී ශ්‍රමණ සම්ප්‍රදායන්ගෙන් අවධාරණය වූයේ සමාජ ජීවිතයේදී මිනිසා අපේක්ෂා කරන දූ දරුවන් , දේපළ වැනි දේ ආධ්‍යාත්මික ජීවිතය සම්බන්ධයෙන් සිතන විට නිරර්ථක හිස් දේ බවයි. ඒවා මූලික වශයෙන් ජාති, ජරා, මරණ වැනි දුක් කරදර වැළඳ ගැනිමකි. මේ භෞතික සියල්ල අත්හැර ආධ්‍යාත්මික, ශික්ෂණය සෙවීම කෙරෙහි බෞද්ධ, ජෛන වැනි ශ්‍රමණ සම්ප්‍රදායන් යොමු වී ඇත.

භගවද් ගීතාවේ විශේෂත්වය වන්නේ ආධ්‍යාත්මික ජීවිතයේ ඵලයන් නෙළාගැනිමට සමාජ ජීවිතයෙන් හෝ ඒ සමාජ ජීවිතයට අදාළ වගකීම්වලින් හෝ යුතුකම්වලින් ඉවත්වීම අනවශ්‍ය බව දැක්වීමයි. මේ අදහස තහවුරු කිරීමට භගවද් ගීතාවේ විශේෂ සංකල්පයක් ගැන සඳහන්වේ. එනම් නිෂ්කාම සංකල්පයයි. ගීතාවේ සදාචාර සංකල්ප අතර වඩාම වැදගත් සංකල්පයද එයයි. ඉන් ඉගැන්වෙන්නේ ක්‍රියාවේ නොයෙදී එය අත්හැරීම නොව කළයුත්තේ ක්‍රියාවේ යෙදෙන අතරම එහි නොඇලීමයි.[8] එනම් පෞද්ගලිකව තමන්ට ඇතිවන වාසි හෝ අවාසි මෙනෙහි නොකොට යම් ක්‍රියාවක් කිරීමට කෙනෙකුට හැකියාව ඇත්නම් එය උසස්ම ආධ්‍යාත්මික තත්වයට පත් වීමකි. කෙනෙකුට තමන් පිළිබඳවත් අනුන් පිළිබඳවත් ඇතිවන හැඟීම පෞද්ගලික වූ බැඳීමකින් ඇතිවන්නකි. එවැනි බැඳීම්වලින් ඉවත්ව අවස්ථාවට උචිත පරිදි තම යුතුකම ඉටුකිරීමට හැකියාව තිබිය යුතුය. මේ අනුව ආධ්‍යාත්මික ශික්ෂණය සඳහා සමාජ වගකීමෙන් ඉවත් විම අනවශ්‍ය බව ගීතාව අවධාරණය කරයි. භගවද් ගීතාවෙන් ඉදිරිපත් කරන්නේ එවකට පිළිගත් ආධ්‍යාත්මික ජීවිතයේ විමුක්තිය උදෙසා ලෞකික බැඳීම්වලින් ඉවත්විය යුතුය යන මතය ප්‍රතික්ෂේප කොට ආධ්‍යාත්මික ජීවිතයත් ලෞකික ජීවිතයත් අතර ගැටුමක් නොමැති බව පෙන්වීමයි.

අපගේ අධ්‍යයනය සම්බන්ධව සලකා බලන විට භගවද් ගීතාවේ සහ බුදු සමයේ ඇතැම් කරුණු අතර එකඟතාවක් පැවතිම නිසා එවැනි කරුණු කෙරෙහිද අවධානය යොමුකිරීම වැදගත්ය.

පුද්ගල සංසාරගත බැඳීම් සම්බන්ධ භගවද් ගීතාවේ ආකල්පය බෞද්ධ ආකල්පයට සමාන වන බව පෙනේ. ගීතාවට අනුව පුද්ගලයා සසරට බැඳ තබනුයේ සත්ව, රජස්, තමස් යන ත්‍රිවිධ ගුණයන් විසිනි. සත්ව ගුණය සැපයෙහි ඇලෙන අතර රජස් ගුණය කර්මයෙහි ඇලෙයි. තමස් ගුණයෙන් නුවණ අවුරා සිටින නිසා ප්‍රමාදයෙහි ඇලෙයි.[9] ඒ සම්බන්ධ බෞද්ධ